# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

## දුරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය

ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි දෙවන පරීක්ෂණය (බාහිර) - 2022
2024 දෙසැම්බර්/ 2025 ජනවාරි

මානවශාස්ත්‍ර පීඨය

## සාහිත්‍ය විචාරය
(නව නිර්දේශය)

**සංස්කෘත සාහිත්‍ය විචාරයේ විකාසය LTCR 28224**

පළමුවන ප්‍රශ්නය ඇතුළු ව ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

**ප්‍රශ්න සංඛ්‍යාව : 09 යි.** **කාලය : පැය 03 යි.**

---

01. ධ්වනිවාදය හා වක්‍රෝක්තිවාදය කෙරෙහි අවධානය යොමු කරමින් පහත පද්‍ය පන්තිය පිළිබඳ රසාස්වාදයක් සපයන්න.

දණක් පමණ මල් අතුරපු දිව යහ නේ
පමණක් බිසව් සැතපෙන කල දුටු සී නේ
මැණිකක් දකින කොට ගැබ ඇතුළට වැදූ නේ
මොන මොන දෙයක් දෝනොදැනෙ'යි සුවාමි නේ

නේරංජනං ගංගාවේ සුදු වැල් ලේ
නේරංජනේ ඉස්නානේ සෙවණැල් ලේ
පැන්නා වටකරට සුවඳට මන ලොල් ලේ
පෙන්නා දිදී දරු සීනය පෙළින් පෙ ලේ

දෙනෝ දහක් අඟනෝ මට මල් නෙළු වා
අනෝතත්ත විල මැද යහනක ඉඳු වා
කන්‍යාලියෝ දෙදෙනෙකු පැන් නැවෙව් වා
අනෝතත්ත විල මම සීනෙන් දුටු වා

සුදු සක ලෙසට ඇත් පැටියෙක් විත් යහ නේ
සුදු සොඬ ටිකෙන් මගෙ බඩ පිරිමදිති අ නේ
සුදු යම් දෙයක් සිදු වෙයි මට දුටු සී නේ
සුද සුන් නිරිඳුනේ මොකද'යි ඔය සී නේ

02. "කාව්‍යස්‍යාත්මා ධ්වනිඃ" යන ප්‍රකාශය ධ්වනිවාදයේ මූලික පදනම වන අයුරු විමර්ශනය කරන්න.

03. ගුණ-රීතිවාදය විකාසනය වූ ආකාරය සමාලෝචනය කරන්න.

04. පෙරදිග කාව්‍ය විචාරාගත වක්‍රෝක්තිවාදය පිළිබඳ විමසීමක් කරන්න.

05. ඖචිත්‍යවාදය පිළිබඳ ප්‍රාමාණික හැඳින්වීමක් කරන්න.

06. "ව්‍යංග්‍යය ප්‍රමුඛ වන කල්හි ධ්වනිය ඇති වේ." යන ප්‍රකාශය අභිමත නිදර්ශනාශ්‍රයෙන් විග්‍රහ කරන්න.

07. නූතන සිංහල කාව්‍ය විචාරයේ දී වක්‍රෝක්තිවාදයෙන් ලැබෙන පිටිවහල කෙබඳු' දැයි සනිදර්ශනව පැහැදිලි කරන්න.

08. ඖචිත්‍යවාදය ප්‍රායෝගිකව විචාර කාර්ය සඳහා යොදාගත හැකි ආකාරය යශෝදරාවතින් නිදසුන් දෙමින් සාකච්ඡා කරන්න.

09. සංස්කෘත විචාරවාද අතර ඇති අන්‍යෝන්‍ය සම්බන්ධය පිළිබඳ විචාරාත්මක ඇගයීමක් කරන්න.

(සෑම පිළිතුරකට ම ලකුණු 20 බැගිනි)

*****************************